**කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ පුහුණු කිරීමේ සහකාර (අධ්‍යයන) හා පුහුණු කිරීමේ සහකාර තනතුරු සඳහා වන උසස් කිරීමේ පටිපාටිය**

**01. සම්බන්ධ වන ආයතනය**

1.1 දෙපාර්තමේන්තුව : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ

යොමු අංකය : DTET/04/02/02/Tr.As/pro දිනය: 2024.03.07

1.2 අමාත්‍යාංශය : අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපනඅමාත්‍යාංශය

යොමු අංකය : MSVRI/ADM/11/06/1/5-1/2018(VOL .II) දිනය: 2024.10.04

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංකය : DMS/1176/V-III/(T) දිනය: 2024.02.05

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමු අංකය : EST-2/04/REC/14386 දිනය: 2024.07.10

1.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/09-01-08/2025 දිනය: 2025.12.19

**02. පත්කිරීමේ බලධරයා :** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරි

3.2 ශ්‍රේණි : III , II හා I

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හිදී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන , තොරතුරු හා දත්ත රැස් කිරීම, විශ්ලේෂණය /සම්පාදනය /වාර්තා සම්පාදනය/ සමීක්ෂණය වැනි කාර්යයන් නිශ්චිත කාර්යභාරයක් වූ ද බඳවා ගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්යභාරයක් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැකිය.

**04. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය**

ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත



ral

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN4-2025

5.2 මාසික වැටුප් පරිමාණය : 53,060-10x800– 11x1,190 – 10x1,320– 5x1,350–94,100/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| III | පියවර 01 | 53,060 /- |
| II | පියවර 12 | 62,250/- |
| I | පියවර 23 | 75,470/- |

**06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා එම තනතුරුවලට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පුහුණු කිරීමේ සහකාර(අධ්‍යයන) | III , II , I | 31 | තාක්ෂණ/කාර්මික විද්‍යාලවල විෂය ක්ෂේත්‍රයට අයත් පාඨමාලාවන්හි දේශන හා පුහුණු කිරීමේ කටයුතු නියමිත කාලය තුළ නියමිත ප්‍රමිතියෙන් යුතුව පවත්වාගෙන යාම හා පවරනු ලබන වෙනත් රාජකාරි |
| පුහුණු කිරීමේ සහකාර | III , II , I | 09 | තාක්ෂණ/කාර්මික විද්‍යාලවල අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ රාජකාරී යටතේ ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

පුහුණු කිරීමේ සහකාර (අධ්‍යයන) – 31

පුහුණු කිරීමේ සහකාර - 09

**07. බඳවා ගැනීමේ ක්‍රමය:** මෙම තනතුර දැනට සිටින නිලධාරීන්ට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් නැවත බඳවාගැනීමක් සිදු නොවේ.

**08. කාර්යක්ෂමතා කඩඉම්**

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ ස්වභාවය : ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | IIIවන ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | * |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයක් මඟින් (ඇමුණුම 01) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | භෞතික හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පැය 40ට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කිරීම |

* නැවත බඳවා ගැනීමක් සිදු නොවන බැවින් සහ දැනට සිටින සියලුම නිලධාරීන් I වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී ඇති බැවින් අදාළ නොවේ.

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද: අවම වශයෙන් වර්ෂයකට වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම } කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

**09. භාෂා ප්‍රවීණතාව**

9.1 සියලුම නිලධාරීන් 2007.07.01 දිනට පෙර බඳවා ගෙන ඇති බැවින් අදාළ නොවේ.

**10. ශ්‍රේණි උසස් කිරීම**

10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.1.1.1.සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීමේ බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.

II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීමේ බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘතිය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීමේ බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

- සංලක්ෂය - සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීමේ දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11.** **තනතුරුවලට පත් කිරීම :** අදාළ නොවේ.

**12.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :** අදාළ නොවේ.

**13.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ඇමුණුම 02

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

**16.** මෙම උසස් කිරීම් පටිපාටියෙහි විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ගනු ඇත.

**17.** අන්තර්කාලීන විධිවිධාන : අදාල නොවේ.

සකස් කළේ : අත්සන : ..........................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම :.......... ඩී. එස්. රාජිකා පෙරේරා
පරිපාලන නිලධාරි

තනතුර :.......... කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

දිනය :.......... 2026.02.11 ..........

පරීක්ෂා කළේ : අත්සන..........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

බී.ඒ.එම්.ඒ. බාලසූරිය
නම :.......... අධ්‍යක්ෂ (පරිපාලන) - II ..........
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

තනතුර :.......... තැ.පෙ. 557, බිල්කට් මාවත, කොළඹ 10. ..........

දිනය :.......... 2026.02.12 ..........

**නිර්දේශ කර ඉදිරිපත් කරමි.**

අත්සන :..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඩී. වතසලා මාරඹගේ
අධ්‍යක්ෂ ජනරාල්
නම :.......... කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, බිල්කොට් මාවත,
කොළඹ - 10

තනතුර : ..........................................

නිල මුද්‍රාව : ..........................................

දිනය .......... 2026/2/12 ..........



nd

**18.** අමාත්‍යාංශ නිර්දේශය

යොමු අංකය : MS/AT/ADM/11/06/1/5-1/2018 (vol-ii)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.12.19 දින අනුමත කරන ලද කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවෙහි ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ පුහුණු කිරීමේ සහකාර (අධ්‍යයන) හා පුහුණු කිරීමේ සහකාර තනතුරු සඳහා වන උසස් කිරීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන: ..........

නම :..........

තනතුර : ..........

නිලමුද්‍රාව : ..........

දිනය: 2026/02/26

ශාලක ඔලුගල
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

---

**19.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය

යොමු අංකය : PSC/EST/09-01-08/03/2025

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ පුහුණු කිරීමේ සහකාර (අධ්‍යයන) හා පුහුණු කිරීමේ සහකාර තනතුරු සඳහා වන උසස් කිරීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2025.12.19 දින අනුමත කරන ලදී.

අත්සන :..........

(ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව)

නම :..........

තනතුර : ..........

නිලමුද්‍රාව : ..........

දිනය: 2026.05.8

ඇමුණුම -01

**<u>පුහුණු කිරීමේ සහකාර (අධ්‍යයන) හා පුහුණු කිරීමේ සහකාර තනතුරු සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය</u>**

1. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 02 | 100 | 40% |
| 2. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 02 | 100 | 40% |

2. විභාගය පවත්වනු ලබන බලධරයා : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

3. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : අවම වශයෙන් වර්ෂයකට වරක්

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති |
| 2.මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පරිච්ඡේද I, II, III, IV, V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |

සකස් කළේ: අත්සන :..............................
නම :........ [illegible] ........
පරිපාලන නිලධාරි
තනතුර :........ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
දිනය :.....2026 . 02 . 11.....

පරීක්ෂා කළේ :..............................
නම :........ බී.ඒ.එම්.ජී. බාලසූරිය
අධ්‍යක්ෂ (පරිපාලන) - II
තනතුර :........ අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
දිනය :..... තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10.
2026. 02. 12

අත්සන :..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
ඩී. වත්සලා මාරඹගේ
අධ්‍යක්ෂ ජනරාල්
නම : කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,
තනතුර : කොළඹ - 10
නිල මුද්‍රාව :..............................
දිනය :..... 2026/2/12 .....

ඇමුණුම-02

<u>සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම.</u>

මෙම පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 මඟින් ලබා දී ඇති MN 4 – 2025 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට හෝ ශ්‍රේණියට පත් කරන ලද දිනය පදනම් කරගෙනය. කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වන වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම සිදු නොකළ යුතුය.

**(i) MN 4 -III ශ්‍රේණිය**

(අ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහය (10) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ආ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

**MN 4 - III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

**(ii) MN 4 – II ශ්‍රේණිය**

(අ) MN 4 -2025 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) නොඅඩු එහෙත් අවුරුදු විස්සකට (20) නොවැඩි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම III ශ්‍රේණියේ වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති හා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්,

(ආ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්,

(ඇ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයක් (10) සම්පූර්ණ වුවද අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්,

**MN 4 – II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

**(iii) MN 4 - I ශ්‍රේණිය**

(අ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ III ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු විස්සකට (20) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක විස්සක් (20) උපයාගෙන ඇති හා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් ,

(ආ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ II ශ්‍රේණියේ යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන ඇති හා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්,

(ඇ) MN 4 – 2025 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති නිළධාරීන්,

**MN 4 – I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.**

සකස් කළේ: අත්සන :.................................

නම :.................................................
ඊ. එස්. රාජිකා පෙරේරා
පරිපාලන නිලධාරී

තනතුර :.......කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව...

දිනය :....2026.02.11....

පරීක්ෂා කළේ :අත්සන :.........................

බී.ඒ.එම්.ඒ. බාලසූරිය

නම :..........අධ්‍යක්ෂ (පරිපාලන) - II..........
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

තනතුර ......තැ.පෙ. 557, ඕල්කට් මාවත, කොළඹ 10.

දිනය :....2026.02.12....

අත්සන :.................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)

ඩී. පත්සලා මාරඹගේ

නම : .................................................
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ.පෙ. 557, ඕල්කොට් මාවත,

තනතුර : .................................................
කොළඹ 10

නිල මුද්‍රාව : .................................................

දිනය : ....2026/2/12....



n9